# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.23 පැය 0630 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1930/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>**

### 01. දුම්රියක ගැටී පුද්ගලයෙකු මියයාම - වැල්ලවත්ත පොලිස් වසම.

2025.10.22 වන දින සවස් කාලයේ වැල්ලවත්ත පොලිස් වසමේ වැල්ලවත්ත දුම්රිය ස්ථානය ආසන්නයේදී පානදුර සිට පුත්තලම බලා ධාවනය වූ දුම්රියක ගැටී පුද්ගලයෙකු මියගොස් ඇති බවට වැල්ලවත්ත පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මියගිය පුද්ගලයා අවසන් වරට කළු පැහැති දිග කලිසමක් හා සුදු නිල් පැහැති අත්කොට කමිසයක් හැඳ සිට ඇති අතර වයස අවුරුදු 60 ක් පමණ වූ අයෙකි. මෘත ශරීරය කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වැල්ලවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - බණ්ඩාරගම පොලිස් වසම.

2025.10.22 වන දින උදෑසන කාලයේ බණ්ඩාරගම පොලිස් වසමේ පානදුර හොරණ මාර්ගයේ කොතලාවල හන්දිය අසලදී අතුරු මාර්ගයක සිට ප්‍රධාන මාර්ගයට ප්‍රවේශ වීමට ගිය යතුරුපැදියක් හොරණ දෙසට ධාවනය වූ මගී බස් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පැදිකරු බණ්ඩාරගම රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා හොරණ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 17 ක් වූ යටියන, බණ්ඩාරගම ප්‍රදේශයේ පදිංචි පාසල් සිසුවෙකි.**

මෘත ශරීරය හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බණ්ඩාරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. මාරක රිය අනතුරක් - පොළොන්නරුව පොලිස් වසම.

2025.10.22 වන දින සවස් කාලයේ පොළොන්නරුව පොලිස් වසමේ හතමුණ හන්දිය හිඟුරක්ගොඩ මාර්ගයේ කිලෝමීටර් 02 කණුව ආසන්නයේදී හතමුණ හන්දිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් විරුද්ධ දිසාවෙන් පැමිණි තවත් යතුරුපැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු, පසුපැදිකරු හා

අනෙක් යතුරුපැදියේ පැදිකාරිය පොළොන්නරුව රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 59 ක් වූ ඇතුමල්පිටිය, පොළොන්නරුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පොළොන්නරුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**